# දැන්වීමයි

Office of the Dean, Faculty of Arts
University of Colombo
22 MAR 2021
16.

අධ්‍යයන කටයුතු/ විභාග කටයුතු සඳහා පැමිණෙන සියලුම පීය වල නේවාසිකාගාර පහසුකම් ලද සිසුන් හට නේවාසිකාගාර වලට පැමිණීමට අවසර දෙනු ලබන්නේ තමන්ට අදාළ අධ්‍යයන කටයුතු/ විභාග කටයුතු **ආරම්භ වන දිනට පෙර දින සිට පමණක්** වන අතර නේවාසිකාගාර වලට පැමිණීමේදී **අත්‍යාවශ්‍ය ඉතා සීමිත බඩු ප්‍රමාණයක් පමණක්** රැගෙන ඒමට අවසර දෙනු ලබයි.

තවද, තම අධ්‍යයන කටයුතු/ විභාග කටයුතු **අවසන් වන දිනට පසු දින උදෑසනම** තමන්ට අයත් සියලුම බඩු බාහිරාදිය රැගෙන නේවාසිකාගාරයෙන් පිට විය යුතුය.

තාවකාලිකව නේවාසිකාගාර පහසුකම් ලැබූ සිසුන් ද තම අධ්‍යයන කටයුතු/ විභාග කටයුතු අවසන් වන දිනට පසු දින උදෑසනම නේවාසිකාගාරයෙන් ඉවත් විය යුතුය.

කිසිදු හේතුවක් මත අදාළ කාල සීමාවෙන් පසුව නේවාසිකාගාරයේ රැඳී සිටීමට අවසර දෙනු නොලැබේ.

තමන්ට වෙන් කර ඇති කාමරයේම පමණක් සිසුන් රැඳී සිටිය යුතු අතර කොවිඩ් 19 වසංගතයෙන් ආරක්ෂා වීම සඳහා පිළිපැදිය යුතු සියලුම සෞඛ්‍යාරක්ෂිත මාර්ගෝපදේශයන් අනුගමනය කළ යුතු බව ද වැඩි දුරටත් දන්වා සිටිමි.

කේ ඒ එස් එඩ්වඩ්
ලේඛකාධිකාරි
19.03.2021